Page 6 April 2013.qxd 15/05/2013 11:42 Page 1





# අයෝමය කාන්තාවගේ අභාවය
# The Iron Lady is no more !
## Mrs Margaret Hilda Thatcher (1925- 2013)

**"I am not a consensus politician.**
**I'm a conviction politician."**
- Mrs Thatcher in 1979

**“ මා ඒකමතිකභාවයේ දේශපාලිකාවක් නොවේ.**
**මා කැපවීමේ දේශපාලිකාවකි.”**

------------

**ම**හා බ්‍රිතාන්‍යයේ හිටපු අගමැතිනිය මාග්‍රට් හිල්ඩා තැචර් මහත්මිය අද අවසන්ගමන් යයි. මේ ලියන මොහොතේ ලන්ඩනයේ ශාන්ත පාවුලු දේවස්ථානයේ විශාල පිරිසකගේ, විශේෂයෙන් මහරැජිණ සහ ආදිපාදවරයාගේ ද, සහභාගිත්ව යෙන් ඇයගේ අවසන් කටයුතු සිදුවෙමින් පවතී. මෙම අවමඟුල බලන්නට මහා ජනකායක් ඒ අවට උදෑසන සිටම පිරී සිටිති.

තැචර් මහත්මිය බ්‍රිතාන්‍යයේ ධනපතීන්ගේ පක්ෂය වන කොන්සර්වේටිව් හෙවත් ටෝරි පක්ෂයේ 1975-1990 දක්වා නායිකාවය. ඇය 1979 දී එවකට බලයේ සිටි ජේම්ස් කැලහන් ගේ ලේබර් හෙවත් කම්කරු පක්ෂය පරදවා බලයට පැමිණ අගමැතිධුරයට පත්වූයේ බ්‍රිතාන්‍යයේ ප්‍රථම අගමැතිනිය වශයෙනි. එවක් පටන් 1990 දක්වා ඇය අගමැති ධුරය ඉසිලූ අතර එසා දීර්ඝ කාලයක් ඒ පදවියේ සිටි තැනැත්තිය ලෙස ද ඇය ඉතිහාසයට එක්වූවා ය.

1979 දී මහා බ්‍රිතාන්‍යයේ ජනතාව ඒ දිනවල රට පුරා සෑම තැනකම දක්නට වූ කම්කරු වැඩවර්ජන ගැන මහත් ලෙස පීඩාවට පත්ව කලකිරී සිටි සමයකි. බලයට ආ ඇය වෘත්තීය සමිතිවලට නිර්දය වූවාය. බ්‍රිතාන්‍ය ආර්ථිකය හදා ගොඩ ගන්නට නම් තද ක්‍රියාමාර්ග ගත යුතුයයි ඇය විශ්වාස කළාය. ඒ සමහර ආර්ථික ප්‍රතිපත්ති සමාන්‍ය ජනයාට හිරිහැරයකියි සමහරු කෑ ගැසුවත් ඇය ඒවාට ඇහුම්කන් දුන්නේ නැත. ඒ යුගයේ අයිආර්ඒ නමැති අයිරිෂ් විප්ලවකාරී කණ්ඩායම ලන්ඩන යේ හැම තැනකම පාහේ බෝම්බ පිපිරවූ කාලයකි. තැචර් මහත්මිය සහ ඇයගේ ඇමති මණ්ඩලය ඝාතනය කරන්නට වූ සැළසුම් බොහෝය. එහෙත් ඇය ත්‍රස්තවාදීන්ට කිසිදු ඉඩක් දුන්නේ නැත. සියල්ල හමුවේ නොපැකිල නොසැලී සිටියාය.

පෝක්ලන්ඩ් යුද්ධය ඇයගේ තරම කොතෙක්දැයි ලොවට පෙන්වූ සාධකයකි. දක්ෂිණ අත්ලන්තික් සාගරයේ බ්‍රිතාන්‍යට අයත් දූපතක්ව තිබෙන පෝක්ලන්ඩ් දූපත තමන්ට අයත් යයි ආර්ජන්ටිනාව සිතයි. මේනිසා 1982 දී එය යටත් කරගැන්ම පිණිස ආර්ජන්ටිනා හමුදාව එයට පහර දුන්නේය. ඔවුන් සිතුවේ තැචර් මහත්මිය අගමැති ධුරයට පත්වූයේ ඒ ළඟදී නිසා, ඇය කාන්තාවක් බැවින් යුද්ධ නොකොට, ආජන්ටින්වට දිනුම දී, දූපතත් ඔවුන්ටම දීලා දාවියයි කියාය. ඔවුන්ගේ සිතුවිල්ල වැරදිය. තැචර් මහත්මිය මෙහිදී ඉතා දැඩි ලෙස කියා සිටියේ ආජන්ටිනාවට පෙරළා පහර දී එළවා දමා, දූපත යළි අත්කර ගන්නා බවටය. ඇය ඒ අනුව ක්‍රියා කළාය. ආජන්ටිනා හටයින් 649 ක්ද බ්‍රිතාන්‍ය සොල්දාදුවන් 255 ක් ද යුද්ධයෙන් මිය ගිය අතර පෝක්ලන්ඩ් දූපත යළි බ්‍රිතාන්‍යයට හිමිවිය. තැචර් මහත්මියගේ කීර්තිය ඉන් තවත් විහිදුණේය. අයන් ලේඩි හෙවත් අයෝමය කාන්තාව යයි ඇයට නමක් පටබැඳුණේ මේ නිසාය.

තැචර් මහත්මියට එදා දොස් කී අය ආර්ථිකය ඇතුලු ඇයගේ ප්‍රතිපත්තිවල හොඳ පැත්ත දකින්නේ දැන්ය. එදා ඇය ත්‍රස්තවාදයට මෘදු මුහුණක් පෙන්නුවා නම් උන් හා සාකච්ඡා වලට ගියානම් තවමත් ලන්ඩනයේ බෝම්බ පිපිරෙනවා ඇත.

මා එංගලන්තයට ආවේ තැචර් මහත්මිය අගමැති වූ අලුතමය. මා වැනිම මෙහි අද සිටින බොහෝ ලාංකිකයෝ ඒ යුගයේ කිසිදු කරදරයකින් තොරව ඉගෙනීමේ කටයුතු කළහ. හොඳ රැකියාවල නියුක්ත වූහ. සිය දරුවන්ට හොඳ අධ්‍යාපන යක්ද ලබා දුන්හ. ආර්ථික කරදරවලින් තොර ජීවිතයකට පදනම සකසාගන්නට අපට හැකිවිය. කුමන හේතුවක් මත කවුරු මොනවා කීවත් මාග්‍රට් තැචර් මහත්මිය කෙරෙහි මෙහි වෙසෙන ශ්‍රීලාංකිකයින් වන අප තුළ විශාල ගෞරවයක් පවතින බව සැබෑය. එතුමියට උතුම් වූ නිවන් සුව අත්වේවා ! - **දයා**

# ස්තූතියි !
# Thanks !

**ල**න්ඩන් බෞද්ධ විහාරය ඇතුළු එක්සත් රාජධානියේ සියළුම විහාරස්ථාන වලට සහ එහි භික්ෂූන් වහන්සේලාට.

ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්යාලයට. ලන්ඩනයේ ශ්‍රීලංකා සංචාරක මණ්ඩලයට. ලංකාවිත්ති පුවත්පත තම ආයතනයට බාරගෙන එය පාඨකයින්ට ලබාගත හැකි පරිදි පෙනෙන තැනක ප්‍රදර්ශණය කළ සියළුම වෙළඳ ආයතන වලට සහ කායශාල වලට. ලංකාවිත්ති බෙදාහරින්නට තම වාහන යොදවමින් එසේම තම පුද්ගලික කාලය අප පත්‍රය වෙනුවෙන් කැපකළ සියළු හිතවතුන්ට. නිවුස්ලංකා පත්‍රයේ කර්තෘන් වන රෙජී ප්‍රනාන්දු මහතා සහ චින්තක ප්‍රනාන්දු මහතාට. මේ වසර 16 පුරා හැම මසකම කැමැත්තෙන්ම ලංකාවිත්ති ලංකාවට ගෙන ගොස් දුන් බොහෝ අයට.

ප්‍රංශයේ පැරිස් නගරයේ පද්මා කුරුප්පු මහත්මියට. අමර ගුණසේකර මහතාට. ප්‍රංශයේ කෝ. ආනන්ද හිමියන්ට හා පරවාහැර චන්ද්‍රරතන හිමියන්ට. ඉතාලියේ දඹදෙණියේ ධම්මාරාම හිමියන්ට. ස්වීඩනයේ ජයා හා ශ්‍රීමතී විජේකෝන් යුවලට, ප්‍රියංවදා බංදුවර්ධන හා චාමලී මදනායක සොයුරියන්ට. නවසීලන්තයේ ආචාර්ය ශ්‍රියා කුමාරසිංහ මහත්මියට. ඕස්ට්‍රේලියාවේ මෛත්‍රී පනාගොඩ, ජපානයේ සිරි හේරත් යන මහත්වරුන්ට, කැලිපෝනියාවේ ශ්‍රීපාලි කොටුවැල්ල, ලොස් ඇන්ජල්ස් හි සුමනා සත්කුමාර, ප්‍රියංකා සීලනාථ මහත්මීන්ට, සයිප්‍රස් හි නිරංජලා මනෝහාරී සහ විමලා යාපා මහත්මීන්ට, කැනඩාවේ ධම්මි විජේසිංහ සහ නෙදර්ලන්තයේ එරංගා පෙරේරා යන මහත්මීන්ට.

ශ්‍රීලංකාවේ නිශාන්ත මෙන්ඩිස් මහතාට, රසිකා උපසේන මහත්මියට, තලංගම ජයසිංහ මහතාට, සහන් රණසිංහ මහතාට, ඩබ්ලිව් කේ. ඩී. නවරත්න මහතාට, ඉරිදා දිවයින කර්තෘ ගාමිණී සුමනසේකර මහතාට, රිවිර පත්‍රයේ චමිල කරුණාරත්න සහ චතුර එස්. කොඩිකාර මහත්වරුන්ට, විමල් රන්ජිත් මහතාට, බර්ටි ගුණසේකර මහතාට තරංගා ආයතනයේ විජය රාමනායක මහතාට, නුගේගොඩ සරසවි පොත්හලට, දයාවංශ ජයකොඩි සමාගමට, ගොඩගේ සමාගමට, වකුල ගුණපාල මහතාට, ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන මහත්මියට, විල්ප්‍රඩ් පෙරේරා, ඩග්ලස් වික්‍රමරත්න, සුජීව නිවුන්හැල්ල, විමල් අලහකෝන්, අනුර හෑගොඩ යන මහත්වරුන්ට.

මෙහි මා සඳහන් කළේ නම් ටිකකි. සඳහන් කරනවා නම් තවත් නම් රාශියක් එකතු කරන්නට සිදුවෙයි. මක්නිසාද ඒ සියල් ලෝම මෙම ලංකා විත්ති පුවත්පතට කිසියම් ආකාරයකින් සම්බන්ධ වී එහි පැවැත්මට කුමන විදියකින් හෝ ආධාර අනුබල දුන් අය නිසාය. ලංකාවිත්තිය ගැන කතාකරන විට විශේෂ කීප දෙනෙක් වෙති.

ලංකාවිත්ති යන නම මට දුන්නේ ශ්‍රීලංකාවේ තරංගා ආයතනයේ විජය රාමනායක හිතවතාය. ප්‍රථම පත්‍රය නිර්මාණය කරන්නට කොම්පියුටරයක් නොතිබුණු මට තම කොම්-පියුටරය ඉඩ දුන්නේ චන්න කබ්රාල් යහළුවාය. චිත්‍ර ඇඳ දුන්නේ චන්දන සෙනෙවිරත්නයි. සිංහළ පාඩම් ආරම්භකර මසක් පාසා ඒවා මට ලියා දුන්නේ සුභද්‍රා සිරිවර්ධන මහත්මියයි. ආනන්ද කාරියවසම් හිතවතා මුල් පිටට මුල්ම පින්තූරය ගෙන දුන්නේය. අපවත්වී වදාළ ලන්ඩන් විහාරයේ වජිරඥාණ නාහිමියෝ ප්‍රථම දහම් ලිපිය ලිවූහ. “ මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය” යන පාඨය මට යෝජනා කළේ මීගස්තැන්නේ රතනජෝති හාමුදුරුවෝය. සිසිර චන්ද්‍රසේකර හිතවතා සියලු නවීන අංගෝපාංග සහිත කොම්පියුටර් පහක්ම පසු කලක මට තෑගි කළේය. ජපානයේ වෙසෙන සිරි හේරත් හිතවතා කොම්පියුටරයට ගැල පෙන ලස්සන සිංහළ අකුරු වර්ග පණස් ගණනක් එවා තිබුණි.

මේ පසුගිය වසර 16 පුරා ලංකාවිත්තියට ලිපි කවි කතා ලියූ සියළු දෙනාටද, ලංකාවිත්ති කියවූ සියළු පාඨක සමූහයාටද, මා දැක හෝ නොදැක මට නිතර සුභ ප්‍රාර්ථනා කළ අයට ද මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. මේ සා විශාල පාඨක සමූහයක් මෙතරම් කුඩා පත්‍රයක් වටා එකතුවුණේ කෙසේදැයි මම තවම පුදුම වෙමි. ජීවිතයේ කිසි දිනක මට ඔබ අමතක නොවේ.

♦ **දයා ආනන්ද රණසිංහ**



Dr Gnanesh, Denzil Lazarus, Rohan Amarasinghe & Lakshmi Perera




සංගීතඥ වික්ටර් රත්නායක ශූරීන් ලංකාවිත්තියේ දසවැනි සංවත්සර පහන දල්වමින්

Maestro Muscian Victor Ratnayake attended 10th Anniversary of Lanka Viththi in 2007 in North London. He is flanked by the Sri Lanka's deputy High Commissioner Mr Sudantha Ganegamaarachchi and Major General Prasad Samarasinghe.



Sri Lanka High Commissioner Mrs Kshenuka Seneviratne lights the lamp at Lanka Viththi's 10 th Anniversary.



Professor
K. N. O. Dharmadasa
මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස